කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams: රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No.: AAIB/8/G/0077

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.:

දිනය / திகதி / Date: 2025.07.29

# <u>මාධ්‍ය නිවේදනය.</u>

## <u>ධීවර කටයුතු ආශ්‍රිතව ජීවනෝපාය සකස් කරගත් කිමිදුම් කටයුතුවල නිරත වන ප්‍රජාව සඳහා හදිසි අනතුරු රක්ෂණ ක්‍රියාවලිය</u>

මේවන විට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් විවිධ කෘෂිකාර්මික වගාවන් හා කෘෂිකර්මාන්තයට අදාළ ක්ෂේත්‍ර සඳහා විවිධ රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දී ඇති අතර, ධීවර ජනතාව වෙනුවෙන් සුවිශේෂී වූ මෙම රක්ෂණ යෝජනා ක්‍රමය කෘෂිකාර්මික හා ගොවිජන මණ්ඩලය විසින් මගින් හඳුන්වා දුන් නවතම රක්ෂණ යෝජනා ක්‍රමය වේ.

මෙම හදිසි අනතුරු රක්ෂණ යොජනා ක්‍රමය, තම ජීවනෝපාය ලෙස කරදිය සහ මිරිදිය මසුන් ඇල්ලීම සඳහා කිමිදුම් කටයුතුවල නිරතව සිටින්නා වූ ධීවර ප්‍රජාව සඳහා හඳුන්වාදී ඇත.

මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මගින්, අයහපත් කාලගුණික/දේශගුණික තත්ත්වයන් හේතු කොටගෙන හෝ ධීවර රැකියාවේ නිරතව සිටින අතරතුර දී සිදුවන ඕනෑම හදිසි අනතුරකින් සිදුවිය හැකි ජීවිතය අහිමිවීම හෝ අනෙකුත් අකර්මණ්‍ය වීම් වලදී රක්ෂණාවරන ලබාදීම සිදුකරනු ලැබේ..

තවද, මෙමගින් ධීවර කටයුතුවලින් බැහැරව සිටින අවස්ථාවකදී වුවද අහඹු අනතුරකින් සිදුවන මරණය හෝ වෙනත් අකර්මණ්‍යතාවන් සඳහා ද ප්‍රතිලාභ සැලසේ. රු.2000/- වැනි වාර්ෂික රක්ෂණ වාරිකයක් යටතේ හදිසි මරණයකදී රුපියල් ලක්ෂ 12 ක මුදලක් වන්දියක් හිමිවේ.

මීට අමතරව පූර්ණ හා තාවකාලික අකර්මණ්‍යතාවයන්හිදී වන්දි ගෙවීම් සිදු කෙරෙන අතර අනතුරක් හේතුවෙන් සිදුවන එක් ඇසක් අහිමිවීම, එක් ගාත්‍රයක් අහිමිවීම, පූර්ණ වශයෙන් කථනය අහිමි වීම වැනි තත්ත්වයන්හිදී ඉතා කඩිනමින් වන්දි ගෙවීමට කටයුතු යොදා ඇති අතර මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ධීවර රැකියාවේ නිරත අයට මහත් පිටුවහලක් වනු ඇත.

ජේමසිරි ජාසිංආරච්චි,
සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

දුරකථන / தொலைபேசி / Telephones
ෆැක්ස් / பெக்ஸ் / Fax

සභාපති
**Chairman**
0094 11 5732279
0094 11 2812573
chairman@aib.gov.lk

අධ්‍යක්ෂ ජනරාල්
**Director General**
0094 11 5732397
0094 11 2812574
dg@aib.gov.lk

ප්‍රධාන කාර්යාලය
**General**
0094 11 2384000